කවරෙකු (අල්ලාහ්ට) බිය වූයේ ද ඔහු ඉක්මන් වේ. කවරෙකු ඉක්මන් වූයේ ද ඔහු නිවසට ළඟා වේ. දැනගනු! සැබැවින්ම අල්ලාහ්ගේ වෙළඳ භාණ්ඩය ඉහළ වටිනාකමින් යුක්ත වේ. දැනගනු! සැබැවින්ම අල්ලාහ්ගේ වෙළඳ භාණ්ඩය ස්වර්ගය වේ?

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. “කවරෙකු (අල්ලාහ්ට) බිය වූයේ ද ඔහු ඉක්මන් වේ. කවරෙකු ඉක්මන් වූයේ ද ඔහු නිවසට ළඟා වේ. දැනගනු! සැබැවින්ම අල්ලාහ්ගේ වෙළඳ භාණ්ඩය ඉහළ වටිනාකමින් යුක්ත වේ. දැනගනු! සැබැවින්ම අල්ලාහ්ගේ වෙළඳ භාණ්ඩය ස්වර්ගය වේ” [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත]

කවරෙකු උත්තරීතර අල්ලාහ්ට බිය වූයේ ද ඔහු පාපයන්ගෙන් දුරස් විය යුතුය. ශුද්ධ වූ අල්ලාහ්ට අවනත වීමෙහි පරිශ්රමය යෙදවිය යුතුය. අල්ලාහ් අබියස ඇති වස්තුව ඉහළ වටිනාකමින් යුක්තය. එය තම ජීවිතය හා ධනය වියදම් කිරීමකින් තොරව එහි වටිනාකමට සමාන නොවන උතුම් ස්වර්ගයයි.

https://sunnah.global/hadeeth/si/show/5434